සියලු ම හිමිකම් ඇවිරිණි/All Right Reserved / முழுப் பதிப்புரிமையுடையது

# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
# இலங்கை அபிவிருத்தி நிருவாக நிறுவகம்
# SRI LANKA INSTITUTE OF DEVELOPMENT ADMINISTRATION

**ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2019 (II)**

**කාලය: පැය 03**

**රජයේ මූල්‍ය පරිපාටි (06)**

විභාග අංකය
Index No / சுட்டெண்
.....................................

- **ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

---

1. ජාතික අයවැය චක්‍රලේඛ 04/2023 ‘2024 අයවැය කැඳවීම සඳහා වු මාර්ගෝපදේශයට අනුව 2024 වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරිමේදි සෑම විටම **‘මුදලට සරිලන අගය (Value For Money) ජනිත වන බවට වග බලාගත යුතු’** බවට දක්වා ඇත.

   I. රාජ්‍ය වියදමක මුදලට සරිලන අගය (Value For Money) යනු කුමක්දැයි පැහැදිලි කර එහි ඇතුලත් සංරචක කවරේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

   II. ඔබගේ ආයතනයේ වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරිමේදි මුදලට සරිලන අගය තහවුරු කිරීම සඳහා සලකා බැලිය යුතු කරුණු කවරේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

2. I. රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේදි පාර්ලිමේන්තුවේ කාර්යභාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

   II. රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ක්‍රියාවලියේදි භාණ්ඩාගාරය යටතේ ක්‍රියාත්මක වන පහත සඳහන් ආයතනවල කාර්යභාරය විස්තර කරන්න.

   අ) රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව (ලකුණු 05)

   ආ) කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව (ලකුණු 05)

3. I. මුදල් රෙගුලාසි 165 අනුව රජයේ කාර්යාලයකට පහත සඳහන් අවස්ථාවලදී මුදල් භාරගැනීම කළයුතු ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

   අ) මු.රෙ. 165 (1) කවුන්ටරයේදී ලැබෙන මුදල් (ලකුණු 03)

   ආ) මු.රෙ. 165 (2) වෙනත් ලැබීම් (ලකුණු 03)

   II. මු.රෙ. 206 අනුව තැන්පතුවලින් ආපසු ගෙවීමේදී සැලකිය යුතු කරුණු කවරේදැයි දක්වන්න. (ලකුණු 06)

   III. රජයේ කාර්යාලයක භාරයේ පවතින මුදල්වල ආරක්ෂාව සම්බන්ධයෙන් මු.රෙ. අනුව පවත්වාගෙන යා යුතු විධිවිධාන කවරේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 08)

4. I. රජයේ දෙපාර්තමේන්තුවකට අවශ්‍ය භාණ්ඩ, වැඩ හා සේවා ප්‍රසම්පාදනයේදී ප්‍රසම්පාදන අස්ථිත්වයේ (Entity) කාර්යයභාරය හා වගකීම පැහැදිලි කරන්න. (ලකුණු 10)

II. 2006 භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවක් මිල සැඳහුම් ප්‍රසම්පාදන ක්‍රමය භාවිත කරමින් පරිගණක මිලදී ගැනීමට තීරණය කළේ නම්, පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ඔබගේ පිළිතුරු සඳහන් කරන්න.

a) උපරිම ඇස්තමේන්තු වටිනාකම (ලකුණු 01)

b) ලංසු ලේඛන ලබාදිය යුතු අවම සැපයුම්කරුවන් සංඛ්‍යාව (ලකුණු 01)

c) සැපයුම්කරුවන්ගේ මූලාශ්‍ර (ලකුණු 02)

d) තෝරාගත් ලංසුකරුවන්ට ලංසු ලේඛන භාර දිය යුතු ක්‍රම (ලකුණු 01)

e) ලංසු භාරගැනීමේ ක්‍රමය (ලකුණු 01)

f) ලංසු විවෘත කිරීමේ ක්‍රමය (ලකුණු 01)

g) ලංසු ඇගයීම් කිරීමේ අදියරයන් (ලකුණු 03)

5. I. 2018 විගණන පනතේ නියමයන්ට අනුව රාජ්‍ය සංස්ථාවක් හෝ රාජ්‍ය සමාගම් විගණනය සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත්කරනු ලබන වාර්ෂික විගණකාධිපති වාර්තාවේ ඇතුළත් කළ යුතු කරුණු කවරේද? (ලකුණු 10)

II. ගණන්දීමේ නිලධාරියාගේ කාර්යභාරය ඉටු කිරීමේදී ආයතනයේ ගණකාධිකාරිවරයෙකු ලෙස ඔබගේ කාර්යයභාරය හා වගකීම දක්වන්න. (ලකුණු 10)

6. කෙටි සටහන් ලියන්න.

I. රාජ්‍ය පුද්ගලික හවුල්කාරීත්ව ව්‍යාපෘති (Public Private Partnership Projects)

II. ශුන්‍යපාදක අයවැයකරණය (Zero-Based Budgeting)

III. ද්විත්ව කවර ලංසු කැඳවීම (Two Envelop System)

IV. විගණන හා කළමනාකරණ කමිටු

(ලකුණු 5X4 =20)

*************